පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 07 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ...............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය පැය 02

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ගෘහස්ත රංග භූමියකි,
  I. ප්‍රොසිනියම් රඟහල
  II. යාග භූමිය
  III. ග්ලෝබ් රඟහල
  IV. ග්‍රීක රඟහල

02. රංග භූමියක් සතුවිය යුතු ලක්ෂණයකි,
  I. සමතලා භූමි ප්‍රදේශයකින් යුක්ත වීම.
  II. නේපත්‍යාගාර පහසුකම් ඉහල මට්ටමක තිබීම.
  III. පසුතලය සැකසීමට සුදුසු විය යුතුය.
  IV. ප්‍රේක්ෂකයන්ට ඉදිරිපස සිට පමණක් නැරඹිය හැකි වීම.

03. නාට්‍ය පෙළ තුළ නළුවා රංගනයේදී සිදු කළ යුතු ක්‍රියාකාරකම් ලියා දක්වා ඇති කොටස හඳුන්වන්නේ,
  I. අභිනය නමිනි.
  II. සමාරෝපණය නමිනි.
  III. අනුකරණය නමිනි.
  IV. රංග විධාන නමිනි.

04. අභිරූපණයක දී භාවිතයට නොගන්නා අභිනය කුමක්ද?,
  I. වාචික අභිනය.
  II. සාත්වික අභිනය.
  III. ආංගික අභිනය.
  IV. ආහාර්ය අභිනය.

05. වේදිකා නාට්‍ය ගීතයකි,
  I. හෝ ගානා පොකුණේ
  II. අකුරු මැකී නෑ
  III. කුමටද සොබනියෙ
  IV. තැන තැන රවුමට ඉඳගෙන

- වරහන් තුළ දී ඇති වචන තෝරා හිස්තැන් පුරවන්න.

06. සබකෝලයෙන් යුතු සිසුන්ට ........................ පැළඳ ගැනීමෙන් රංගනයට පහසුවක් දැනෙයි.
07. රංග කාර්යයේදී සිදු කරනු ලබන සියලු චලන සිදුකරන්නේ ............................ අතර සමෝධානික බවකිනි.
08. ............................. ඒ ඒ චරිතයට උචිත ලෙසින් නිර්මාණය කළ යුතුය.
09. හඬ ඉතා ප්‍රබල වීමටත්, නිවැරදි උච්චාරණයක් ඇති කරගැනීමටත් වඩා සුදුසු වන්නේ ............................. කියවීමයි.
10. සමාජ සාරධර්ම රැක ගැනීම සඳහා ................................ කියවීම වඩා සුදුසු වේ.

[හිස් පළඳනා / සිරිත් මල්දම / වෙස් මුහුණු / මනස හා සිරුර / නම්පොත ]

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හරිනම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

11. චිත්‍ර, මූර්ති, කැටයම් ශ්‍රව්‍ය දෘෂ්‍ය කලාංග වේ. ( )
12. ජීවී හෝ අජීවී වස්තූන් නාට්‍යයක රඟ දක්වා පෙන්විය හැකි වේ. ( )
13. නාට්‍යයකින් කියවෙන පරිසරය මැවීමට ස්වභාවික ලෝකයේ ඇති වස්තූන්ගේ හැඩතල, වර්ණ භාවිත කළ හැකිය. ( )
14. "වෙද පුටුව" යනු රංග ක්‍රීඩාවකි. ( )
15. ස්ථාවර භාවයක් වෙස් මුහුණු වලින් ප්‍රකට වේ. ( )

- පහත වගුව ඇසුරෙන් අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| මහින්දාගමනය | දුටුගැමුණු-එළාර සංග්‍රාමය | මද්දුම බණ්ඩාර | ගෝඨයිම්බරට නම ලැබුණු හැටි | කුවේණී |
| ශ්‍රී මහා බෝධිය වැඩම වීම | සිරිසඟබෝ හිස දන් දීම | වීරපුරන් අප්පු | නන්දිමිත්‍ර කතාව | දෝන කතිරිනා |
| දළදාගමනය | විජය කුවේණී කතාව | කුඩාපොල හාමුදුරුවෝ | නීලමහා යෝධයාගේ කතාව | දෙවැනි මහින්ද |

16. යෝධයින් සම්බන්ධ කතා ඇතුළත් තීරය වන්නේ,
   I. A II. C III. D IV. E
17. රටට හිතැති වීර චරිත කතා ඇතුළත් තීරය වන්නේ,
   I. C II. B III. A IV. E
18. රජවරු හා සම්බන්ධ කතා ඇතුළත් තීරය වන්නේ,
   I. A II. B III. C IV. D
19. වේදිකා නාට්‍ය ඇතුළත් තීරය වන්නේ,
   I. D II. B III. E IV. A
20. ආගමික කතා ඇතුළත් තීරය වන්නේ,
   I. A II. B III. C IV. D

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 04ක් සමග ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) "අමර ගියා දිව්‍ය ලෝකෙ" නාට්‍ය පිටපත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. මෙම නාට්‍යයේ අධ්‍යක්ෂවරයා කවුරුන්ද? (ලකුණු 02)
II. ඔහුගේ වෙනත් නාට්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
III. මෙම නාට්‍යයේ එන අමර පාසල් යාම ප්‍රතික්ෂේප කොට මවගෙන් ඉල්ලන්නේ කුමක්ද? (ලකුණු 02)
IV. මෙහි අමර යහමඟට ගැනීමට දරණ උපාය මාර්ගය කුමක්ද? (ලකුණු 02)
V. එම උපක්‍රමය යෙදීමට මූලික වන චරිතය නම් කරන්න. (ලකුණු 02)
VI. අමර කිරියාට හා ටොමියාට ලබා දෙන්නේ මොනවාද? (ලකුණු 02)

(02)
I. නාට්‍යයක තේමාව යනු කුමක්ද? (ලකුණු 02)
II. ඔබ දන්නා නාට්‍ය හතරක් නම් කර එහි තේමාවන් ලියා දක්වන්න. (ලකුණු 04)

III. වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ

ඉහත කවියේ තේමාවට සුදුසු කතාවක් ලියා දක්වන්න. (ලකුණු 06)

(03)

I. රංග අභ්‍යාස වර්ග දෙකක් නම් කරන්න . (ලකුණු 02)

II. රංග අභ්‍යාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 4ක් නම් කරන්න. (ලකුණු 04)

III. ඔබ පන්තිකාමරයේදී සිදු කළ රංග අභ්‍යාසයක් සිදු කරන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 06)

(04)

I. නාට්‍යෝපකරණ යනු මොනවාද? (ලකුණු 02)

II. නාට්‍යෝපකරණ සැකසීම සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය 04ක් නම් කරන්න. (ලකුණු 04)

III. ඔබ පන්ති කාමරයේදී සකස් කළ නාට්‍යෝපකරණයක් සකසන අයුරු පියවර වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 06)

(05)

I. නාට්‍යයක එන සංවාද අයත් අභිනය නම් කරන්න. (ලකුණු 02)

II. නාට්‍යයක දී නාද අනුකරණය කළ හැකි අවස්ථා 4ක් නම් කරන්න. (ලකුණු 04)

III. සංවාද භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 06)

(06)

I. රංගාභරණ යනු මොනවාද? . (ලකුණු 02)

II. රංගාභරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 04ක් නම් කරන්න. (ලකුණු 04)

III. ඔබ පන්ති කාමරයේදී සකස් කළ හිස් පළඳනාවක් සකස් කළ අයුරු පියවර වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 06)

(07)

''7 ශ්‍රේණියේ සිසුවකු ගණිතය කාලච්ඡේදයේදී ගුරුතුමා උගන්වමින් සිටින අතරතුර නින්දට වැටිනි. ටික වෙලාවකින් ඔහු අනෙක් සිසුන්ගේ කටහඩින් අවදි විය. පාඩම අවසන් වෙමින් තිබිණි. ගුරුතුමා කළු ලෑල්ලේ ගැටලු දෙකක් ලියා ඇති බව ඔහුට පෙනී ගියේය. හෙතෙම ඒවා ඔහුගේ සටහන් පොතට පිටපත් කර ගත්තේ විසඳීමටය. ඒත් එම ගැටලු ඉතා අපහසු බව ඔහුට වැටහිනි. එවිට ඔහු දුටුවේ ගුරුතුමා තමා අසලට පැමිණ ඇති බවයි....''

ඉහත කතාව ඉදිරියට ගෙන යමින් නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ලකුණු 12)